ආයුබෝවන්!

ඇතුලට එන්න...

පටුන

# පටුන


1 සවනකුර - හැඳින්වීමක් ..........4
2 සවනකුර මිලට ගැනීම හෝ ආදර්ශය අත්හදා බැලීම..........6
3 සවනකුර ස්ථාපිත කිරීම..........7
4 සවනකුර ලියාපදිංචි කිරීම..........8
5 සවනකුර ක්‍රියාත්මක කරවීම ..........13
5.1 සවනකුර ක්‍රියාත්මක කරවීම - සවනකුර "ආදර්ශ මෘදුකාංගය "ආයුබෝවන්" පිටුව ..........13
5.2 සවනකුර ක්‍රියාත්මක කරවීම - සවනකුර "පූර්ණ මෘදුකාංගය "ආයුබෝවන්" පිටුව ..........13
5.3 සවනකුර ක්‍රියාත්මක කරවීම - සවනකුර "ප්‍රධාන" පිටුව ..........15
5.4 යතුරු පුවරුවේ අකුරු හැඩයන් තේරීම් ..........17
5.4.1 සවනකුර "ප්‍රධාන පිටුව" - සිංහල, තෝරා ගත්විට ..........17
5.4.2 සවනකුර "ප්‍රධාන පිටුව" - සිංහල, "shift යතුර" තෝරා ගත්විට ..........17
5.4.3 සවනකුර "ප්‍රධාන පිටුව" - ඉංග්‍රීසි, තෝරා ගත්විට ..........18
5.4.4 සවනකුර "ප්‍රධාන පිටුව" - ඉංග්‍රීසි, "shift යතුර" තෝරා ගත්විට ..........18
5.5 සවනකුර ක්‍රියාත්මක කරවීම - විද්‍යුත් හසුන්" පිටුව ..........19
5.6 සවනකුර - විද්‍යාත් හසුන් සම්න්ධීකරණය සහ විද්‍යුත් ලිපිනයන් තේරීම..........20
5.7 සවනකුර "WhatsApp" සම්බන්ධීකරණය ..........21
5.8 ※ තිරය මුලුමණින් මැකීම ආරම්භ කිරීමට ..........22
5.9 සවනකුර - කෙටි හසුන් "SMS" සම්න්ධීකරණය සහ දුර කතන අංක තේරීම..........23
5.10 සවනකුර ක්‍රියාත්මක කරවීම - "අත්වැල් පටුන" පිටුව..........24
5.11 සවනකුර ක්‍රියාත්මක කරවීම - සවනකුර "හෝඩියේ විස්තර" පිටුව ..........25
5.12 සවනකුර ක්‍රියාත්මක කරවීම - "අත්වැල් විස්තර/අක්ෂරයක ශබ්දිම සංකේතයක්" පිටුව..........26
5.13 සවනකුර ක්‍රියාත්මක කරවීම - "අක්ෂර හැඩගැස්වීමේ මනාප " පිටුව ..........27

ඔබේ තේරීම් ගොනුගත කල පසු ක්‍රියාත්මකවන්නේ සවනකුර නැවත පණ ගැන්වූ පසුයි. ..........27
5.13.1 අමතර "යුනිකේත " අකුරු හැඩයන්..........28
5.13.2 අකුරු හැඩයන්හි හැඩරුව දර්ශකය ..........29
5.14 සවනකුර ක්‍රියාත්මක කරවීම - "උපදෙස්" පිටුව ..........30
5.15 සවනකුර ක්‍රියාත්මක කරවීම - "පැරණි හසුන් " පිටුව ..........31
5.15.1 සවනකුර ක්‍රියාත්මක කරවීම - "පැරණි හසුන් ": නැවත කියවීමට..........32
5.15.2 සවනකුර ක්‍රියාත්මක කරවීම - "පැරණි හසුන් ": මැකීමේ/නොමැකීමේ අනුමැතිය ..........33
5.15.3 සවනකුර ක්‍රියාත්මක කරවීම - "පැරණි හසුන් ": නැවත යැවීමට..........34
6 "අප ගැන" පිටුව ..........35

# 1 *සවනකුර - හැඳින්වීමක්*

*සවනකුර* නිර්මාණය කර ඇත්තේ ඇන්ඩ්‍රොයිඩ්™ (Android™) හැසිරවුම් පද්ධතිය ස්ථාපිත කල ජංගම දුර කතන, එලක ආදී උපකරණ ඉලක්ක කරගෙන ය. එහි ක්‍රියාකාරිත්වයට අවම වශයෙන් ඇන්ඩ්‍රොයිඩ්™ අනුවාද අංක 2.2 (Android™ Version 2.2(„Froyo“) සිට 4.0.3 (Android™ Version 4.0.3 „Icecream Sandwich“) හැසිරවුම් පද්ධතක් අවශ්‍යය. වඩා නවතම අනුවාද සිංහල අකුරු නිර්මාණය කර තිරයෙහි දැක්වීම වඩා තාත්විකව කරති.

සිංහලෙන් හසුන් සැකසීමේදී හා ඒවා විද්‍යුත් මාධ්‍ය මගින් යැවීමේදී, පාරිභෝගිකයාහට මේ මෘදුකාංගය තුලින් උපරිම පහසුව සැපයීම මෙම නිපදවීමෙහිලා ප්‍රාථමික අරමුණ විය.

භාවිතයේදී නැගෙන ගැටලු ආදිය නිරාකරණය ගැනීමට ආධාරවිය හැකි ඉතා විස්තරාත්මක අත්වැල් පහසුකම් මේ මෘදුකාංගය තුල අන්තර්ගත කිරීම ද තවත් අරමුණක් විය.

*සවනකුර* මෘදුකාංගයේ විශේෂ ලක්‍ෂණ කීපයක් නම්:

- මේ සඳහා උපකරණයේ ස්පර්ශ සංවේදී තිරය මත, දිස්වෙන 'මෘදු' පරිගණක යතුරු පුවරුවක ආකෘතියක් ආධාරයෙන් සිංහල හසුන් ලිවිය හැකි සේ *සවනකුර* නිර්මාණය කර තිබීම එහි විශේෂ ලක්‍ෂණයකි.
- එසේ ලියන හසුන්, කෙටි හසුන්(SMS) ලෙස හෝ විද්‍යුත් පණිවුඩ ලෙස හෝ යැවිය හැකියි.
- ඒ සමගම, ඔබ යවනා සියලු හසුන්වල පිටපත් උපකරණයේ ම ඉබේ තැන්පත් වේ. ඒවා ඔබට නැවත කියවීමට හෝ නැවත යැවීමට හෝ යොදා ගත හැකිය. එමෙන්ම, අනවශ්‍ය හසුන් හා කල් පැනපු හසුන් උපකරණයෙන් මකා දැමීමේ හැකියාව ද ඔබට ඇත.
- 'මෘදු' යතුරුවේ යතුරු සිංහලෙන් හෝ ඉංග්‍රිසියෙන් දැක්වීම ඔබට තෝරා ගත හැකිය.
- එමෙන්ම, මෘදුකාංගය යොදා ගන්නා සිරස්තල ද සිංහලෙන් හෝ ඉංග්‍රිසියෙන් දැක්වීම ඔබට තෝරා ගත හැකිය.
- ඔබ ලියනා හසුන ඕනෑම වෙලවකදී නවත්වා, පසුව එය ඔබට අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී නැවැත්වූ තැන සිට නැවත ආරම්භ කල හැකියි.


- *සවනකුර - හැඳින්වීමක්*
- *සවනකුර මිලට ගැනීම හෝ ආදර්ශය අත්හදා බැලීම*
- *සවනකුර ස්ථාපිත කිරීම*
- *සවනකුර ලියාපදිංචි කිරීම*
- *සවනකුර ක්‍රියාත්මක කරවීම*
- *සවනකුර අඩුවැඩිය*
- *හසුන් ලිවීම*
- *විද්‍යුත් පණිවුඩ යැවීම*
- „WhatsApp“ *පණිවුඩ යැවීම*
- *කෙටි පණිවුඩ* (SMS) *යැවීම*
- *පෙර යැවූ හසුන්*
  - *නැවත බැලීම*
  - *මකා දැමීම*

- *නැවත යැවීම*
- *අත්වැල්*
  - *සිංහල හෝඩි පිටුව*
  - *ශබ්දිම සංකේත පිටු*

## 2 සවනකුර මිලට ගැනීම හෝ ආදර්ශය අත්හදා බැලීම

සාමාන්‍යයෙන්, මෙම මෘදුකාංගයේ සජීවී පිටපත් "ගූග්ල් ප්ලේ™"(Google Play™) වෙබ් අඩවියෙන් බා ගනු ලැබේ.

නමුත්, එය මිලට ගැනීමට පෙර අත්හදා බැලිය හැකිය. *සවනකුර* මෘදුකාංගයේ ආදර්ශ පිටපතක් ඔබට නොමිලේ අපේ වෙබ් අඩවියෙන් බා ගැනීමට පුලුවනි.. එය ඔබේ ජංගම උපකරණයට කෙලින්ම බා ගන්න.

*සවනකුර* ආදර්ශ මෘදුකාංග ද, පූර්ණ මෘදුකාංග සපයන සේවාවන් ම සපයති. නමුත් වෙනසකට ඇත්තේ විද්‍යුත් පණිවුඩ හෝ SMS පණිවුඩ යැවීමට නොහැකිවීම පමණි.

සවනකුර අපේ වෙබ් අඩවියෙන් මෙසේ බා ගතහොත්, ඒවායේ නවතම කෘතීන් කල් ඇතිව බා ගෙන අත්හදා බැලීමේ අවස්ථාව ඔබට ඇත.

## 3 සවනකුර ස්ථාපිත කිරීම

මෘදුකාංගයේ සජීවී පිටපත්"ගූග්ල් ප්ලේ™"(Google Play™) වෙබ් අඩවියෙන් බා ගත්විට එය ඉබේම ඔබේ උපකරණයේ ස්ථාපිත වේ. ඔබට ඇත්තේ උපකරණයේ ස්ථාපිත මෘදුකාංග අතර සවනකුර සොයා ගොස් එය ක්‍රියාත්මක කරවීම පමණි.

ආදර්ශ පිටපත් ද, ගූග්ල් ප්ලේ™"(Google Play™) වෙබ් අඩවියෙන් බා ගත්විට ඉහත කී පරිදි ඉබේ ස්ථාපිත වේ.

අප වෙබ් අඩවියෙන් බා ගත්විට, මෘදුකාංගය ඔබේ උප්කරණයේ "බා ගැනීමේ ගොනුවේ" (Download Folder) තැන්පත් වේ. ඔබ එය වෙත ගොස් බා ගත් මෘදුකාංග කොපිය තට්ටු කර ක්‍රියාත්මක කල යුතු වෙයි. එවිට එය ස්ථාපිත වීම ඇරඹෙයි. එහිදී නැගෙන ප්‍රශ්න සියල්ලටම එකඟවෙමින් ස්ථාපිත කිරීම අවසන් වෙන තෙක් ඉදිරියටම යන්න. ස්ථාපිත කිරීම අවසන් වූ වහාම ඔබට මෘදුකාංගය අත්හදා බැලීමට ඔබට පුලුවන.

මෘදුකාංගය ස්ථාපිත කිරීමෙන් අනතුරුව, ඔබ බා ගත් ගොනුව මකා දමන්න. එමගින් ඔබට උපකරණයේ ඉඩකඩ ඉතිරි කර ගැනීමට පුලුවනි.

## 4 සවනකුර ලියාපදිංචි කිරීම

සවනකුර ලියාපදිංචි කිරීම අවශ්‍ය වන්නේ පූර්ණ මෘදුකාංගය අපේ වෙබ් අඩවියෙන් මිලට ගතහොත් පමණි.

මේ පහසුව විශේෂයෙන්ම ලංකාවේ credit card නොමැති අනුග්‍රාහකයන්ගේ පහසුව තකා අප ඉදිරිපත් කරන ක්‍රම විධියකි..

ඔබ සවනකුර සඳහා මුදල් ගෙවිය යුත්තේ සම්පත් බැංකුවට ය..

ගෙවීමේ විස්තර නම්:

ඔබට ඒ සඳහා ගෙවීම් කුවිතාන්සියක් බැංකු ශාඛාවෙන් ලබාගන්න. ඒ ෆෝර්මයක ආකෘතියක් පහත දැක්වේ



පරිඝණක වලංගු කිරීම සඳහා/ கணனி பதிவிற்கு/ Computer Validation Only

SAMPATH BANK PLC - PQ 144

සම්පත් බැංකුව / சம்பத் வங்கி / SampathBank

ගිණුම් අංකය/ கணக்கு இலக்கம்/ Account No.

ගිණුම් හිමියාගේ නම/ கணக்கு வைத்திருப்பவரின் பெயர் / Name of Account Holder

CASH DEPOSIT SLIP / මුදල් තැන්පතු / பணம் வைப்பு

දිනය/ திகதி/ Date

තැන්පත්කරුගේ අත්සන / வைப்பாளரின் கையொப்பம் / Depositor's Signature

පරිඝණක වලංගු කිරීමක් හෝ නිලධරයකුගේ අත්සනක් නොමැතිවිට මෙය වලංගු නොවන්නේය. / This receipt is not valid without a computer validation or an official signature.

| මුදල් තැන්පතු සඳහා/ பண வைப்புக்கு/ For Cash Deposits | | |
|---|---|---|
| නෝට්ටු / தாள்கள் / Notes | රු. / ரூபா / Rs. | ශත / தம் / Cts. |
| x 5000 | | |
| x 2000 | | |
| x 1000 | | |
| x 500 | | |
| x 200 | | |
| x 100 | | |
| x 50 | | |
| x 20 | | |
| x 10 | | |
| කාසි/ நாணயங்கள்/ Coins | | |
| එකතුව/ மொத்தம்/ Total | | |

For cash deposits above Rs. 500,000/- deposited by persons other than the account holder.

තැන්පත් කරන්නාගේ නම / வைப்பாளரின் பெயர் / Depositor's Name

ජා.හැ.ප අංකය / தே.அ.அ.இல. / N.I.C Number

දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No.

තැන්පතුව ලැබූ මාර්ගය / Source of Deposit / வைப்பு தொகையின் விபரம்

Form No. 002

GRAPHIC SYSTEMS

එය පුරවා බැංකුවට දෙන්න.

මුදල් තැන්පත් කරන්නාගේ නම වශයෙන් ඔබේ නම සඳහන් කරන්න.

ගෙවීම් අංකය වශයෙන් ඔබේ ජාතික හැඳුනුම් අංකය යොදන්න. මේ අංකය ඔබේ ගිණුම තුලින් පරිගණකයට ඇතුලු කරන ලෙස බැංකුවට දන්වා සිටින්න.

- ,,ගිණුම් අංකය" වශයෙන් අපේ බැංකු ගිණුමේ අංකය යොදන්න.
- ,,ගිණුම් හිමියාගේ නම" වශයෙන් "PhonoText“ ඇතුලත් කරන්න.
- අත්සන් කර ෆෝර්මය බැංකුවට දෙන්න.
- සවනකුර මිලට ගැනීම මෙයින් සමාප්ත වෙයි.

එසේ අප වෙබ් අඩවියෙන් බා ගෙන ස්ථාපිත කර මුල් වරට ක්‍රියාත්මක කලවිට, ලියා පදිංචි කිරීමේ ක්‍රියාවලිය ඇරඹෙයි.. එය පියවර 2 කින් යුත යි:

## පියවර 1: PhonoText ආයතනයෙන් ලියා පදිංචි අංකයක් ඉල්වීම




මුල් වරට *සවනකුර* ක්‍රියාත්මක කලවිට ඔබට ලියාපදිංචි අංකයක් PhonoText වෙතින් ලබා ගත යුතු වෙයි.

ඒ සඳහා ඔබ වෙත මෙවැනි තිරයක් ඉදිරිපත් වෙයි. තව දුරටත් ඉදිරියට යාමට එහි අඩංගු „ලියා පදිංචි අංකය ඉල්වීම" ස්පර්ශ කරන්න .




එවිට වමතින් දැක්වෙන රූපය ඉදිරිපත් වෙයි. එහි එක් පේලියක ඔබේ උපකරණයේ අනුක්‍රමික අංකය දැක්වෙයි. එය ඔබේ උපකරණයේ අනන්‍යතාව පෙන්වයි.

ඊට පහලින් දැක්වෙන „ඔබේ ගෙවීම් අංකය නිවැරදිව පහතින් ඇතුල් කරන්න" යන පේලියට පහතින් ඇති කොටුවේ ඔබේ ජාතික හැඳුනුම් අංකය ඇතුල් කරන්න.

ඊට පසු ඉල්ලුම අප වෙත එවීමට „යවන්න" බොත්තම ස්පර්ශ කරන්න. ඒ සමගම ක්‍රියාත්මක වෙන „G Mail" හෝ „Email" මෘදුකාංගය මගින් යවන්න.

ඒ ඉල්ලුම අප වෙත ලැබුණු විට ඔබේ ගෙවීම පිලිබඳව අපි අපේ බැංකු ගිණුමේ සටහන සෝදිසි කර, ගෙවීම සටහන් වූ වහාම ඔබට ලියාපදිංචි අංකයක් අපි ඔබට විද්‍යුත් පණිවුඩයක් මගින් එවන්නෙමු.

එතෙක් මෘදුකාංගය වසා දමන්න.

ඒ අංකය ලැබුණුවිට එය පහත දැක්වෙන පරිදි මෘදුකාංගයට ඇතුල් කරන්න.




ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ ඊ ලග පියවර වශයෙන්, නැවත මෘදුකාංගය ක්‍රියාත්මක 1වෙනි පියවරෙන් පසු ක්‍රියාත්මක කල විට වමතින් දැක්වෙන රූපය දිස්වේ.

ඔබට ලියාපදිංචි අංකය අපෙන් ලැබුණු වහාම ඔබට මේ පියවර ගත හැකියි.

ඉදිරියට යාමට „ලියාපදිංචි අංකය ඇතුල් කිරීම“ බොත්තම ස්පර්ශ කරන්න.

එවිට පහත දැක්වෙන රූපය ඉදිරිපත් වෙයි.

## පියවර 2: ලියා පදිංචි අංකය ඇතුල්කිරීම සහ ස්ථාපිත කිරීම සම්පූර්ණ කිරීම




ඔබට අප එවූ විද්‍යුත් ලිපිනයේ අඩංගු ලියාපදිංචි අංකය පිටපත් කර, „ඔබට ලැබුණු ලියා පදිංචි අංකය නිවැරදිව පහතින් සපයන්න“ පේලියට පහතින් ඇති කොටුවට ඇතුල් කරන්න.

ඊට පසු „ඇතුල් කරන්න“ බොත්තම ස්පර්ශ කර ලියාපදිංචි අංකය මෘදුකාංගය තුලට ඇතුල් කරන්න.

ඊට පසු *සවනකුර* මෘදුකාංගය වසා නැවත ක්‍රියාත්මක කිරීමෙන් පසුව ඔබට නොකඩවා පාවිච්චි කරගෙන යා හැකියි.

*සවනකුර* වෙබ් අඩවියෙන් බා ගැනීමට කෙලින්ම ගෙවීමක් නොකෙරේ.

# 5 සවනකුර ක්‍රියාත්මක කරවීම

## 5.1 සවනකුර ක්‍රියාත්මක කරවීම - සවනකුර "ආදර්ශ මෘදුකාංගය "ආයුබෝවන්" පිටුව




මේ ඔබ මෘදුකාංගය *සවනකුර ආදර්ශ මෘදුකාංගය* ක්‍රියාත්මක කල වහාම දකිනා පිටුවයි. මෘදුකාංගය ඇතුලට පිවිසීමට වරක් තට්ටු කරන්න, නැතහොත් තත්පර කිහිපයකින් "ප්‍රධාන පිටුවට" ඉබේම ඇතුලුවීම කෙරෙයි.

---

## 5.2 සවනකුර ක්‍රියාත්මක කරවීම - සවනකුර "පූර්ණ මෘදුකාංගය "ආයුබෝවන්" පිටුව



මේ ඔබ මෘදුකාංගය *සවනකුර පූර්ණ මෘදුකාංගය* ක්‍රියාත්මක කල වහාම දකිනා පිටුවයි. මෘදුකාංගය ඇතුලට පිවිසීමට වරක් තට්ටු කරන්න, නැතහොත් තත්පර කිහිපයකින් "ප්‍රධාන පිටුවට" ඉබේම ඇතුලුවීම කෙරෙයි.

---

**මින් ඉදිරියට දැක්වෙන විස්තර, සවනකුර (ආදර්ශ හා පූර්ණ) මෘදුකාංග දෙකට ම අදාල වේ**

## *5.3* සවනකුර ක්‍රියාත්මක කරවීම - සවනකුර "ප්‍රධාන" පිටුව




ප්‍රධාන පිටුව: මේ පිටුව කොටස් 3 කින් යුක්තයි:
**1 වෙනි කොටස: (ඉහලින්ම) "හසුන ලියවෙන පෙදෙස" වේ.**
**2 වෙනි කොටස:** ***සවනකුර*** **ඔබ වෙත යොමු කරන පණිවුඩ දර්ශණය වෙන කොටස (මැද තීරුවක්) ඔබ "දැනුවත් කිරීමේ පෙදෙස"** වේ.
**3 වෙනි කොටස: 'මෘදු' යතුරු ලියනය සහිත කොටස "යතුරු පුවරු පෙදෙස"** වේ

**1 වෙනි කොටස: "හසුන ලියවෙන පෙදෙස"**

ඔබ ශබ්දිම සංකේත යොදා යතුරු ලියනයෙන් ඇතුල් කරනා සංකේත අනුසාරයෙන් ජනනය කරනා සිංහල අක්ෂර මේ කොටසේ අකුරෙන් අකුර එකතු වේ. එසේ එකතුවී ඔබේ හසුන හැඩ ගැසෙන්නේ මේ පෙදෙසේ ය.

එසේම, මීට කලින් සැසි වාරයේදී ඔබ ලියමින් තිබුණු හසුන කිසියම් හේතුවක් නිසා හෝ අවසන් නොකර උපකරණය වසා දැම්මේ නම් හෝ වැසී ගියේ නම්, ඒ හසුන් ඛණ්ඩය *සවනකුර* විසින් සුරකිව තබාගෙන ඇති නිසා, එය *සවනකුර* ආරම්භයේදී මෙතනින් ම ඔබ වෙත ඉදිරිපත් කෙරේ.

මේ අවස්ථාවේදී ඔබට ඒ හසුන් ඛණ් ඩය නැවත පාවිච්චි කිරීමට හෝ මකා දැමීමට පුලුවන. මකා දැමීම ※ බොත්තමට තට්ටු කිරීමෙන් පුලුවනි. මකා දැමීමෙන් පසුව ඔබට නව හසුනක් ලිවීමට හැකියි.

**2 වෙනි කොටස: "ඔබව දැනුවත් කරන පෙදෙස".**

*සවනකුර* නොයෙක් අවස්ථාවල දී ඔබව දැනුවත් කිරීමට නිකුත් කරන පණිවුඩ දිස් වන්නේ මේ පෙදෙසේ යි.

**3 වෙනි කොටස: "යතුරු පුවරු පෙදෙස"**

1 වැනි හා 2 වැනි පෙදෙස් මෙම මෘදුකාංගයේ වැදගත්ම කොටස් දෙකයි.

ඔබට ඉදිරිපත් කරන යතුරු පුවරුව, පරිගණක යතුරු පුවරුවකට ආසන්න අනුරූපයක් ගනී. මෙහි යතුරු පේලි 6 ක් තිබේ. යතුරුවල අකුරු, ඔබේ තේරීම අනුවයි.
ඔබ අත්වැල්/"ඔබේ තේරීම්" හරහා ඇතුල්වී "පුවරුවේ බස "සිංහලෙන්" යයි තෝරා ගතහොත්, ඒවා දැක්වෙන්නේ සිංහලෙන්. නමුත්, " In English" යයි තෝරා ගතහොත්, දැක්වෙන්නේ ඉංග්‍රිසියෙන්.
එසේම, යතුරු පුවරුවේ "shift යතුර" තෝරා ගතහොත් හෝ "ලොකු අකුරුවලම සිටින්න" යතුර තෝරා ගතහොත්, ඒ අනුව අකුරු වෙනස් වේ. මේ තත්වයන්ට අදාල රූප සහ සටහන් පහත දැක් වේ.

අත්වැල්/"ඔබේ තේරීම්" හරහා ඇතුල්වී "පුවරුවේ බස" 'In English'යන තේරීම් කලහොත්, යතුරු ලියනය දකින්නේ මේ ආකාරයටයි:

**Row 1:** අංක (0-9) පේලිය
**Row 2:** මේ පේලියේ "q" සිට "p" දක්වා සහ "[" සහ "]"
**Row 3:** මේ පේලියේ "a" "l" සහ ";" සහ """ සහ නව පේලියක් ඇරඹීමේ "return" යතුර: "?"
**Row 4:** මේ පේලියේ: "shift යතුර": "?" සහ "z" සිට "m" දක්වා සහ "," සහ "." සහ "/" සහ "ලොකු අකුරුවලම සිටින්න" යතුර: "??"
**Row 5:** මේ පේලියේ "→→→→" ( (දර්ශකය දකුණට ගෙන යන) යතුර)
"✂⇢" (ඉදිරියට මකන්න)
"ඉඩකඩ" යතුර
"&#xu21e0 ✂" (ආපස්සට මකන්න)
"←←←←" (දර්ශකය වමට ගෙන යන) යතුර
**Row 6:** මේ පේලියේ තිබෙන්නේ:

- **"සිංහලෙන්" සිංහල භාෂාව තෝරා ගැනීමට;**
- **"Eng" බොත්තම ඉංග්‍රිසි භාෂාව තෝරා ගැනීමට;**
- **"?' අත්වැල් පිටුව විවෘත කිරීමට**
- **🖂 විද්‍යුත් හසුන් යැවීම ආරම්භ කිරීමට**
- **"SMS" කෙටි හසුන්(SMS) යැවීම ආරම්භ කිරීමට**
- „WhatsApp" හරහා හසුන් යැවීමට
- **※ තිරය මුලුමණින් මැකීම ආරම්භ කිරීමට**

අත්වැල්/"ඔබේ තේරීම්" හරහා ඇතුල්වී "පුවරුවේ බස "In English" තෝරා, "shift යතුර" තෝරා ගතහොත් හෝ "ලොකු අකුරුවලම සිටින්න" යතුර තෝරා ගතහොත් යතුරු ලියනය දකින්නේ මේ ආකාරයටයි:

## *5.4* යතුරු පුවරුවේ අකුරු හැඩයන් තේරීම්

### 5.4.1 සවනකුර "ප්‍රධාන පිටුව" - සිංහල, තෝරා ගත්විට




අත්වැල්/"ඔබේ තේරීම්" හරහා ඇතුල්වී "පුවරුවේ බස "සිංහලෙන්"යන තේරීම් කලහොත්, යතුරු ලියනය දකින්නේ මේ ආකාරයටයි:

### 5.4.2 සවනකුර "ප්‍රධාන පිටුව" - සිංහල, "shift යතුර" තෝරා ගත්විට




අත්වැල්/"ඔබේ තේරීම්" හරහා ඇතුල්වී "පුවරුවේ බස "සිංහලෙන්"යන තේරීම් කර, "shift යතුර" පාවිච්චි කළ විට, යතුරු ලියනය දකින්නේ මේ ආකාරයටයි:

## 5.4.3 සවනකුර "ප්‍රධාන පිටුව" - ඉංග්‍රිසි, තෝරා ගත්විට



අත්වැල්/"ඔබේ තේරීම්" හරහා ඇතුල්වී "පුවරුවේ බස "ඉංග්‍රිසියෙන් "යන තේරීම් කලහොත්, යතුරු ලියනය දකින්නේ මේ ආකාරයටයි:

## 5.4.4 සවනකුර "ප්‍රධාන පිටුව" - ඉංග්‍රිසි, "shift යතුර" තෝරා ගත්විට



අත්වැල්/"ඔබේ තේරීම්" හරහා ඇතුල්වී "පුවරුවේ බස "ඉංග්‍රිසියෙන්" යන තේරීම් කලහොත්, යතුරු ලියනය දකින්නේ මේ ආකාරයටයි:

## *5.5* සවනකුර ක්‍රියාත්මක කරවීම - විද්‍යුත් හසුන්" පිටුව



ඔබ මේ පිටුවට අවතීර්ණවන්නට තීරණය කරන්නේ, ඔබේ හසුන ලියා අවසන්කොට, එය විද්‍යුත් හසුනක් ලෙස යැවීමට සූදානම් වූ විට ය.

මේ පිටුව තිරයට පැමිණෙන්නේ යතුරු පුවරුවේ 6 වෙන් පේළියේ "✉" යතුර තෝරා ගැනීමෙනි.

එවිට, හසුන ඉවත්වී, ඒ කොටසේ විද්‍යුත් ලිපිනයන් ඉදිරිපත් කරන අවස්ථාව එලඹෙයි .

"විද්‍යුත් හසුන්" පිටුව: මේ පිටුව කොටස් තුනකින් යුක්තයි:

**1 වෙනි කොටස:** විෂය ලියන්නේ මේ කොටසේ යි.

**2 වෙනි කොටස:** විෂය ලිවීමට ඇරයුම දැක්වෙන්නේ මේ කොටසේ යි.

එවිට, ඔබට, ඔබේ උපකරණයේ පවත්වාගෙන යන මිතුරන්ගේ විද්‍යුත් ලිපිනයන් ලැයිස්තුව ඉදිරිපත් කෙරේ .
වැදගත්: මේ ලැයිස්තුවේ දිග අනුව මේ ලැයිස්තුව සැකසීමට වේලා ගතවිය හැකියි!!!

ඔබට ඒ ලැයිස්තුවෙන් අවශ්‍ය ග්‍රාහකයන් තෝරා ගත හැකියි.

එසේ කරන්නේ, මිතුරන්ගේ නම් තට්ටු කිරීමෙනි. නමක් මත නැවත තට්ටු කිරීමෙන් ඒ තේරීම අවලංගු කල හැකියි.

තේරීම් සියල්ලම අවලංගු කර තේරීම් නැවත ඇරඹීමට, "යලි තෝරන්න" බොත්තම යොදා ගන්න.

තෝරා ගත් මිතුරන් වෙත හසුන යැවීමට, "යවන්න" බොත්තම යොදා ගන්න.

ඔබව, ඇන්ඩ්‍රොයිඩ් මගින් ඔබේ උපකරණයේ ස්ථාපිත කර ඇති විද්‍යාත් හසුන් සේවා සමග සම්බන්ධ කෙරෙයි. ඔබ කැමති සේවාවක් තෝරා, අනුමැතිය දුන් පසු, හසුන යැවේ.

ඔබ යවනා සෑම කෙටි හසුනක පිටපතක් *සවනකුර* මතු ප්‍රයෝජනය සඳහා තබා ගනියි. එසේ තබා ගන්නා හසුන් ලැයිස්තුව "පෙර කෘති ලැයිස්තුව" හරහා බලා ගත හැකියි.

## 5.6 සවනකුර - විද්‍යාත් හසුන් සමන්ධිකරණය සහ විද්‍යුත් ලිපිනයන් තේරීම



ඔබ මේ පිටුවට අවතීර්ණවන්නට තීරණය කරන්නේ, ඔබේ හසුන ලියා අවසන්කොට, එය විද්‍යුත් හසුනක් ලෙස යැවීමට සූදානම් වූ විට ය. >
>
මේ පිටුව තිරයට පැමිණෙන්නේ යතුරු පුවරුවේ 6 වෙන් පේළියේ "🖂" යතුර තෝරා ගැනීමෙනි.
>
එවිට, හසුන ඉවත්වී, ඒ කොටසේ විද්‍යුත් ලිපිනයන් ඉදිරිපත් කරන අවස්ථාව එලඹෙයි .

"විද්‍යුත් හසුන්" පිටුව: මේ පිටුව කොටස් තුනකින් යුක්තයි:

**1 වෙනි කොටස:** විෂය ලියන්නේ මේ කොටසේ යි.

**2 වෙනි කොටස:** විෂය ලිවීමට ඇරයුම දැක්වෙන්නේ මේ කොටසේ යි.

**3 වෙනි කොටස:** යතුරු පුවරුව
ඒ සඳහා ඔබට ඇරයුමක්: "විෂය ඉහතින් දක්වන්න", 2 වෙනි කොටසෙන් ඉදිරිපත් කෙරෙයි.
එවිට ඔබේ හසුනට අදාල විෂය ඒ කොටසේ, එනම් 2 වැනි කොටසේ, ලියන්න.
නැවතත් "🖂" යතුර එබීමෙන්, ඔබේ කෘතිය විද්‍යුත් හසුනක් සේ ඔබට යැවිය හැකිය.

එවිට, ඔබට, ඔබේ උපකරණයේ පවත්වාගෙන යන මිතුරන්ගේ විද්‍යුත් ලිපින ලැයිස්තු පිටුව )ඉහතින් දැක්වෙන) ඉදිරිපත් කෙරේ .

වැදගත්: මේ ලැයිස්තුවේ දිග අනුව මේ ලැයිස්තුව සැකසීමට වේලා ගතවිය හැකියි!!!

ඔබට ඒ ලැයිස්තුවෙන් අවශ්‍ය ග්‍රාහකයන් තෝරා ගත හැකියි.

එසේ කරන්නේ, මිතුරන්ගේ නම් තට්ටු කිරීමෙනි. නමක් මත නැවත තට්ටු කිරීමෙන් ඒ තේරීම අවලංගු කල හැකියි.

තේරීම් සියල්ලම අවලංගු කර තේරීම් නැවත ඇරඹීමට, "යලි තෝරන්න" බොත්තම යොදා ගන්න.

තෝරා ගත් මිතුරන් වෙත හසුන යැවීමට, "යවන්න" බොත්තම යොදා ගන්න.

ඔබව, ඇන්ඩ්‍රොයිඩ් මගින් ඔබේ උපකරණයේ ස්ථාපිත කර ඇති විද්‍යුත් හසුන් සේවාව සමග සම්බන්ධකොට හසුන යැවේ.

ඔබ යවනා සෑම කෙටි හසුනක පිටපතක් සවනකුර මතු ප්‍රයෝජනය සඳහා තබා ගනියි. එසේ තබා ගන්නා හසුන් ලැයිස්තුව "පෙර කෘති ලැයිස්තුව" හරහා බලා ගත හැකියි.

## *5.7* *සවනකුර* "WhatsApp" සම්බන්ධීකරණය



WhatsApp" පිටුව: ප්‍රධාන පිටුවේ ඔබ හසුන ලියා, එය "WhatsApp" මෘදුකාංගය හරහා යැවීමට අවශ්‍ය වූ විට, ඔබ "W" ලාංඡණය ස්පර්ශ කළ විට ඔබව ඔබ උපකරණයේ ස්ථාපිත කර ඇති "WhatsApp" මෘදුකාංගය ක්‍රියාත්මක කරවයි.

එවිට, "WhatsApp" මෘදුකාංගය, මේ පිටුව ප්‍රදර්ශණය කර, ඔබේ "WhatsApp" ග්‍රාහක ලැයිස්තුව ඉදිරිපත් කරයි. එයින් ඔබ කැමති ග්‍රාහකයන් තෝරා හසුන ඒ අයට යවනා ලෙස උපදෙස් දුන් විට, ඔබේ හසුන ඒ ප වෙත යැවෙයි.

මෙසේ ඔබ යවනා සෑම හසුනක පිටපතක් *සවනකුර* මතු ප්‍රයෝජනය සඳහා තබා ගනියි. එසේ තබා ගන්නා හසුන් ලැයිස්තුව "පෙර කෘති ලැයිස්තුව" හරහා බලා ගත හැකියි.

## 5.8 ※ තිරය මුලුමණින් මැකීම ආරම්භ කිරීමට



ඔබ ලියාගෙන ආ හසුන එක්කො මකා දමා නැවත අලුතින් ආරම්භ කිරීමට හෝ හසුන තාවකාලිකව ආරක්ෂාව සඳහා රැක තබා ගැනීමට අවශ්‍ය වූ විට "“ ලාංඡනය හරහා මේ පිටුවට ප්‍රවේශ විය හැකියි.

එවිට ඔබට හසුන මකා දැමිය හැකියි („මකන්න") ස්පර්ශ කිරීමෙන්, නැතහොත් පිටපතක් තබා ගෙන තවදුරටත් ඉදිරියට හසුන ලියාගෙන යා හැකියි („තබා ගන්න" ස්පර්ශ කිරීමෙන්).

මෙසේ තබා ගන්නා පිටපත් "පැරණි හසුන් " පිටුව හරහා ඔබට නැවත ප්‍රයෝජනයට ගත හැක.

## *5.9* සවනකුර - කෙටි හසුන් "SMS" සමන්ධීකරණය සහ දුර කතන අංක තේරීම



ඔබ මේ පිටුවට අවතීර්ණවන්නට තීරණය කරන්නේ, ඔබේ හසුන ලියා අවසන්කොට, එය කෙටි හසුනක් ලෙස යැවීමට සූදානම් වූ විට ය. >
>
මේ පිටුව තිරයට පැමිණෙන්නේ යතුරු පුවරුවේ 6 වෙන් පේලියේ "SMS" කෙටි හසුන" යතුර තෝරා ගැනීමෙනි.

එවිට, ඔබට, ඔබේ උපකරණයේ පවත්වාගෙන යන මිතුරන්ගේ දුර කතන අංක ලැයිස්තුව ඉදිරිපත් කෙරේ .

වැදගත්: මේ ලැයිස්තුවේ දිග අනුව මේ ලැයිස්තුව සැකසීමට වේලා ගතවිය හැකියි!!!

ඔබට ඒ ලැයිස්තුවෙන් අවශ්‍යා ග්‍රාහකයන් තෝරා ගත හැකියි.

එසේ කරන්නේ, මිතුරන්ගේ නම් තට්ටු කිරීමෙනි. නමක් මත නැවත තට්ටු කිරීමෙන් ඒ තේරීම අවලංගු කල හැකියි.

තේරීම් සියල්ලම අවලංගු කර තේරීම් නැවත ඇරඹීමට, "යලි තෝරන්න" බොත්තම යොදා ගන්න.

තෝරා ගත් මිතුරන් වෙත හසුන යැවීමට, "යවන්න" බොත්තම යොදා ගන්න.

ඔබව, ඇන්ඩ්‍රොයිඩ් මගින් ඔබේ උපකරණයේ ස්ථාපිත කර ඇති කෙටි සේවාව සමග සම්බන්ධකොට හසුන යැවේ.
ඔබ යවනා සෑම කෙටි හසුනක පිටපතක් සවනකුර මතු ප්‍රයෝජනය සඳහා තබා ගනියි. එසේ තබා ගන්නා හසුන් ලැයිස්තුව "පෙර කෘති ලැයිස්තුව" හරහා බලා ගත හැකියි.

## *5.10* සවනකුර ක්‍රියාත්මක කරවීම  - "අත්වැල් පටුන" පිටුව



"අත්වැල් පටුන??Help Index" පිටුව: මේ පිටුව කොටස් තුනකින් යුක්තයි:

**1 වෙනි කොටස:** සිංහල හෝඩිය
**2 වෙනි කොටස:** මේ පිටුව පාවිච්චි කරනා අන්දම
**3 වෙනි කොටස:** තේරීම් කිහිපයක්

**1 වෙනි කොටස:** මේ කොටසේ සිංහල හෝඩිය දැකිය හැකියි. එක් එක් අක්ෂරය සඳහා එක් එක් එක් බොත්තම් බැගින් වෙන් කර තිබේ.This block of buttons show the Sinhala alphabet

ඔබ කැමති බොත්තමක් තද කිරීමෙන්, "අත්වැල් විස්තර" පිටුවට යා හැකියි.Pressing a button activates a "Help Detail" page.

ඔබ තෝරාගත් අක්ෂරයට අදාල අනු අක්ෂර(ප්‍රභේද) සියල්ල මේ පිටුවේ දැක්වේ.

**2 වෙනි කොටස:** ඔබ අවධානය යොමුකරවන හා උපදෙස් මේ කොටසේ දැක්වේ.

**3 වෙනි කොටස:** මේ කොටසේ ඔබ වෙත තේරීම් කිහිපයක් ඉදිරිපත් කෙරේ:

- "ඔබේ තේරීම්/Choice" මේ බොත්තම ආධාරයෙන් "ඔබේ තේරීම්/Choice" පිටුවට අවතීර්ණ විය හැකියි. වැඩි විස්තර පහතින් දැක්වේ.
- "උපදෙස්" ඒ බොත්තම ආධාරයෙන් මේ අත්වැල් පිටුවට අවතීර්ණ විය හැකියි.
- "පෙර කෘති" බොත්තම ආධාරයෙන් ඔබ මෙතෙක් කල් යැවූ සහ තවමත් ඔබ ඉතිරි කරගෙන ඇති හසුන් ලැයිස්තුවක් දැක්වෙන පිටුවට යා හැකියි.
- "අප ගැන" බොත්තම ආධාරයෙන් *සවනකුර* සම්බන්ධයෙන් හා අප ගැන විස්තර දැන ගත හැකියි.

## *5.11* සවනකුර ක්‍රියාත්මක කරවීම - සවනකුර "හෝඩියේ විස්තර" පිටුව




"අත්වැල් විස්තර" පිටුව: මේ පිටුව කොටස් තුනකින් යුක්තයි:

**1 වෙනි කොටස:** සිංහල අක්ෂර
ඔබ සිංහල හෝඩියෙන් තෝරාගන්නා අක්ෂරයට අදාල අනු අක්ෂර සියල්ල මේ පිටුවේ දැක්වේ. එක් එක් අනු අක්ෂරයකට එක් එක් බොත්තමකි.

මේ අනු අක්ෂර බොත්තමක් තද කිරීමෙන් ඒ අනු අක්ෂරය ජනනය කිරීමට ඔබ යතුරු පුවරුවෙන් ලිය යුතු ඉංග්‍රිසි ශබ්දිම සංකේත බලා ගත හැක.

උදා: ඔබට "කෲ" ලිවිය යුතු නම්, එයට අදාල ශබ්දිම සංකේත අමතකවී ඇත්නම්, ඔබ කල යුත්තේ,"ප්‍රධාන පිටුවේ" "?" බොත්තම තද කර, "අත්වැල්" පිටුවට ගොස්, එහි "ක" අඩංගු බොත්තම තද කර "ක" අක්ෂරයට අදාල "අත්වැල් විස්තර" පිටුවට පලමුව අවතීර්ණ වීමයි.

ඊට පසු, එම පිටුවේ "කෲ" අඩංගු බොත්තම තද කල විට, අදාල ශබ්දිම සංකේතය, එනම් "kruu" දැක ගත හැකියි. ඊට පසු නැවත හසුන ලියනා "ප්‍රධාන පිටුවට" ආප්සු ගොස් "kruu" ලියූ විට, "කෲ" ඔබේ ලිපියට එකතු වේ.

**2 වෙනි කොටස:** මේ පිටුව පාවිච්චි කරනා පිලිවෙල දක්වයි.

## *5.12* සවනකුර ක්‍රියාත්මක කරවීම - "අත්වැල් විස්තර/අක්ෂරයක ශබ්දිම සංකේතයක්" පිටුව



"අත්වැල් විස්තර" පිටුව: මේ පිටුව කොටස් තුනකින් යුක්තයි:

**1 වෙනි කොටස:** සිංහල අක්ෂර
ඔබ සිංහල හෝඩියෙන් තෝරාගන්නා අක්ෂරයට අදාල අනු අක්ෂර සියල්ල මේ පිටුවේ දැක්වේ. එක් එක් අනු අක්ෂරයකට එක් එක් බොත්තමකි.

මේ අනු අක්ෂර බොත්තමක් තද කිරීමෙන් ඒ අනු අක්ෂරය ජනනය කිරීමට ඔබ යතුරු පුවරුවෙන් ලිය යුතු ඉංග්‍රිසි ශබ්දිම සංකේත බලා ගත හැක.

උදා: ඔබට "ක්‍යා" ලිවිය යුතු නම්, එයට අදාල ශබ්දිම සංකේත අමතකවී ඇත්නම්, ඔබ කල යුත්තේ,"ප්‍රධාන පිටුවේ" "?" බොත්තම තද කර, "අත්වැල්" පිටුවට ගොස්, එහි "ක" අඩංගු බොත්තම තද කර "ක" අක්ෂරයට අදාල "අත්වැල් විස්තර" පිටුවට පලමුව අවතීර්ණ වීමයි.

ඊට පසු, එම පිටුවේ "ක්‍යා" අඩංගු බොත්තම තද කල විට, අදාල ශබ්දිම සංකේතය, එනම් "kyaa" දැක ගත හැකියි. ඊට පසු නැවත හසුන ලියනා "ප්‍රධාන පිටුවට" ආපසු ගොස් "kyaa" ලියූ විට, "ක්‍යා" ඔබේ ලිපියට එකතු වේ. (වමේ ඇති රූපය බලන්න)

**2 වෙනි කොටස:** මේ පිටුව පාවිච්චි කරනා පිලිවෙල දක්වයි.

## *5.13* සවනකුර ක්‍රියාත්මක කරවීම - "අක්‍ෂර හැඩගැස්වීමේ මනාප " පිටුව




ඔබ සවනකුර ප්‍රථම වතාවට ක්‍රියාත්මක කලවිට මේ පිටුවට ලඟාවේ.

එසේම, ඔබ අවශ්‍යවන ඕනෑම වේලාවකදී, මේ පිටුවට "ප්‍රධාන පිටුවේ" සිට "?" මාර්ගයෙන් "අත්වැල්" පිටුවට ද, එතනින් "ඔබේ තේරීම්/Choices" බොත්තම හරහා මේ පිටුවට පිවිසිය හැකිය.

"ඔබේ තේරීම්/Choices":මේ පිටුව කොටස් 5 කින් යුක්තයි:

**1 වෙනි කොටස:** පිටුවේ සිරස් තලය
**2 වෙනි කොටස:** පිටු සිරස් තල සහ වෙනත් විස්තර සඳහා භාවිත කල යුතු භාෂා තේරීම
**3. වෙනි කොටස:** දැනට භාවිතවන අකුරු හැඩය
**4.** අකුරු හැඩය මාරු කිරීමට මේ බොත්තම ස්පර්ශ කර ඒ පිටුවට අවතීර්ණ වන්න.
**5.** හසුන් ලිවීමට දැනට භාවිතවන අකුරු මිතිය
**6.** හසුන් ලිවීමට වෙනත් අකුරු මිතියක් මේ ලැයිස්තුවෙන් තෝරා ගන්න
**7.** යතුරු පුවරුවේ දැනට භාවිතවන අකුරු මිතිය
**8.** හසුන් ලිවීමටයතුරු පුවරුවට
**9.** ඔබේ මනාප ඉදිරියට ස්ථාපිත කිරීමට ඔබ උපකරණයේ ගොනුගත කරන්න.

***ඔබේ තේරීම් ගොනුගත කල පසු ක්‍රියාත්මකවන්නේ සවනකුර නැවත පණ ගැන්වූ පසුයි.***

## 5.13.1 අමතර "යුනිකේත " අකුරු හැඩයන්




ප්‍රධාන පිටුවේ හසුන් ලිවීමට යොදා ගත හැකි අකුරු හැඩය ලැයිස්තුවක් මේ පිටුවේ දැක්වේ.

**කොටස 1:** පිටු සිරස්තලය

**කොටස 2:** දැනට ඔබ යොදා ගන්නා අකුරු හැඩය

**කොටස 3:** නව හැඩයක් මේ ලැයිස්තුවෙන් ඔබට තෝරා ගත හැක. කැමති හැඩයක් ස්පර්ශ කරන්න. එවිට එම හැඩය 4 වෙනි කොටසේ ප්‍රදර්ශණය වේ. ඒ සමගම ඔබව ඒ තේරීම අනුමත කිරීමේ පිටුවට ඔබව රැගෙන යේ. ඒ විස්තර පහත දැක් වේ.

**කොටස 4:** ඔබ ලැයිස්තුවෙන් තේරූ හැඩය මෙහි දැක් වේ.

## 5.13.2 අකුරු හැඩයන්හි හැඩරුව දර්ශකය



ඔබ තේරූ හැඩය මෙතැන් සිට යොදා ගන්නවා ද, නැද්ද යන්න මේ පිටුවෙන් ඔබට තීරණය කල හැකියි.

**කොටස 1:** ඔබ තේරූ අකුරු හැඩය මෙහි දැක් වේ
**කොටස 2:** ඔබ තේරූ අකුරු හැඩයෙන් සිංහල අකුරු දර්ශණය වන්නේ කෙසේදැයි ඔබට අවබෝධයක් මේ කොටසෙන් ලබා දෙමු.
**කොටස 3:** ඔබ ඒ අකුරු හැඩයට කැමති නම්, මේ බොත්තම ස්පර්ශ කරන්න. එවිට ඔබේ තේරීම මින් ඉදිරියට යොදා ගැනීම සඳහා රඳවා ගනු ලැබේ. ඒ සමගම මේ පිටුවෙන් "පිටවීම" සඳහා බොත්තමක් 5 වෙනි කොටසේ ප්‍රදර්ශණය වෙනු ඇත.
**කොටස 4:** ඔබ ඒ අකුරු හැඩයට කැමති නැති නම්, මේ බොත්තම ස්පර්ශ කරන්න. ඒ සමගම මේ පිටුවෙන් "පිටවීම" සඳහා බොත්තමක් 5 වෙනි කොටසේ ප්‍රදර්ශණය වෙනු ඇත.
**කොටස 5:** මේ "පිටවීම" බොත්තම ස්පර්ශ කිරීමෙන් ඔබට මේ පිටුවෙන් පිටවිය හැක.

## 5.14 සවනකුර ක්‍රියාත්මක කරවීම - "උපදෙස්" පිටුව



මේ සවනකුර භාවිත කිරීමේ කෙටියෙන් උපදෙස් දක්වන පිටුවයි.

මේ පිටුව ඔබට සිංහලෙන් හෝ ඉංග්‍රිසියෙන් කියවිය හැක.

## *5.15* සවනකුර ක්‍රියාත්මක කරවීම - "පැරණි හසුන් " පිටුව



ඔබ මෙතෙක් කල් යැවූ සහ තවමත් ඔබ වෙනුවෙන් තවම ඉතිරි කරගෙන ඇති හසුන්, විද්‍යුත්("✉") සහ කෙටි හසුන්(SMS), ලැයිස්තුවක් මේ පිටුවෙන් ඉදිරිපත් කෙරේ.

"පැරණි හසුන් " පිටුව: මේ පිටුව කොටස් 2 කින් යුක්තයි:

**1 වෙනි කොටස** මේ පිටුවේ සිරස්තලයයි
**2 වෙනි කොටස:** මේ කොටසේ හසුන් ලැයිස්තුව අඩංගුය
සෑම හසුනක වර්ගය ද, යැවූ දිනය සහ වේලාව ද මෙහි දැක් වේ. ඔබ කැමති පේලියක් මත තට්ටු කලහොත්, ඒ හසුනේ අඩංගු දේ පෙන්වන පිටුවට යාමට හැකිය.

## 5.15.1 සවනකුර ක්‍රියාත්මක කරවීම - "පැරණි හසුන් ": නැවත කියවීමට



මේ පිටුව කොටස් 3 කින් යුක්තයි:
**1 වෙනි කොටස:** මේ පිටුවේ සිරස්තලයයි
**2 වෙනි කොටස:** හසුනේ අඩංගු වූ දේ
**3 වෙනි කොටස:** ඔබට ඒ හසුන සම්බන්ධයෙන් ගත හැකි පියවර දැක්වෙන බොත්තම් දෙකක්:
"ආපසු ගන්න" බොත්තම තද කිරීමෙන් හඟවන්නේ ඔබට ඒ හසුන තවදුරටත් රඳවා ගැනීමට උවමනා බවත්, ඒ හසුන දැන් නැවතත් යැවීමට අවශ්‍ය බවත් ය.

එවිට ඔබව කෙලින්ම "ප්‍රධාන පිටුවට" රැගෙන යේ. එහි හසුන් ලියනා කොටසේ, ඔබ තෝරාගත් හසුනේ අඩංගු දේ දැකිය හැකිවනු ඇත. මේ අවස්ථාවේදී ඔබට ඒ දේ ඇති සේ ම හෝ වෙනස් කර, අවශ්‍ය මාධ්‍යයකින්, විද්‍යුත්("🖂") සහ කෙටි හසුන්(SMS) නැවත යැවිය හැකි ය.

"මකන්න" බොත්තම තද කිරීමෙන් දක්වන්නේ ඔබට ඒ හසුන උපකරණයෙන්ම් සම්පූර්ණයෙන් ම මකා දැමීමට ඇති උවමනාවයි.
මේ බොත්තම තද කිරීමෙන් "හසුනක් මැකීමේ/නොමැකීමේ අනුමැතිය" පිටුවට ප්‍රවිෂ්ඨවිය හැක. ඒ විස්තර පහත දැක් වේ.

## 5.15.2 සවනකුර ක්‍රියාත්මක කරවීම - "පැරණි හසුන් ": මැකීමේ/නොමැකීමේ අනුමැතිය



හසුනක් මැකීමේ/නොමැකීමේ අනුමැතිය" පිටුව: මේ පිටුව කොටස් 3 කින් යුක්තයි: :

**1 වෙනි කොටස:** මැකීමට තෝරාගත් හසුනේ නම.
**2 වෙනි කොටස:** මැකීමට තෝරාගත් හසුනේ අඩංගු දේ.
**3 වෙනි කොටස:** ඔබට ගත හැකි ක්‍රියා මාර්ග දෙකකි: ඒ අනුමැතිය දීමට හෝ නොදීමට ය.

- අනුමැතිය දීමෙන් ඒ හසුන සදහටම ඔබේ උපකරණයෙන් මැකී යයි.
- අනුමැතිය නොදීමෙන් ඔබව නැවත හසුන් ලැයිස්තුව වෙත රැගෙන යේ.

### 5.15.3 සවනකුර ක්‍රියාත්මක කරවීම - "පැරණී හසුන් ": නැවත යැවීමට

ඔබ කල යුත්තේ "ආපසු ගන්න" බොත්තම ස්පර්ශ කිරීම පමණී. එවිට ඔබෙ තෝරාගත් හසුනේ අඩංගු හසුන ඔබේ නව ලිපියක් ලෙස ඔබට ලබා දෙයි. ඊට පසු ඉහත දක්වා ඇති පරිදි එය විද්‍යුත් හසුනක් හෝ කෙටි හසුනක් ලෙස හෝ ඔබට යැවිය හැකිය.

# 6 "අප ගැන" පිටුව



මේ පිටුවෙන් අප ආයතනය සම්බන්ධයෙන් සුලු විස්තරයක් ද, මේ සවනකුර නිර්මාණයට පාදක වූ ශ්‍රී ලංකා යුනිකේත ප්‍රමිතිය ආදී දේ ගැන කියවිය හැකිය.

"අප ගැන" ඉංග්‍රිසි කොඩිය මත තට්ටු කිරීමෙන් ඉංග්‍රිසි භාෂාවෙන් ද කියවිය හැක.

අප ගැන වැඩි විස්තර දැන ගැනීමට අපේ වෙබ් අඩවියට ද මෙතනින් පිවිසෙන ලෙස ආරාධනය කරමු.

Copyright 2013